**ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 2020 දෙසැම්බර්31 දිනටමූල්‍ය තත්ත්ව ප්‍රකාශනයසහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයසහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනයඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)ප්‍රමිත අංක 02 ප්‍රකාරව, මුදලින් ලද රු. 3,490,300 ක ගොඩනැගිලි කුලී ආදායමක් හා රු. 41,542,500 පොළී ආදායමක් අඩුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | ගොඩනැගිලි කුලී ආදායම රු.3,490,300 ආයෝජන ක්‍රියාකාරකම් යටතේ හඳුනා නොගැනීම 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.<br>පොළී ආදායම් පෙර වසරට (2019) අදාලව සමාලෝචිත වර්ෂයේ ලද පොළිය හා සමාලෝචිත වසරට අදාලව ලද පොළිය රු.41,373,394 මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇත. | ප්‍රමිත අංක 02 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළයුතු වීම. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) හෝටල් පාසල් 9 ක ලියාපදිංචි ගාස්තු, විභාග ගාස්තු සහ පාඨමාලා ගාස්තු මුළු ආදායම රු.22,176,300 ක් විය යුතු වුවත් එය රු.15,539,450 ක් ලෙස මුදල් පදනමින් හඳුනාගැනීම හේතුවෙන්සමාලෝචිත වර්ෂය සඳහා ආදායම හා ලැබිය යුතු ආදායමරු.6,636,850 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් හා අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | හෝටල් පාසල්වල ආදායම් නිවැරදිව ගණනය කළයුතුවීම. |
| (ආ) සංචාරක පොලිස් ඒකකයෙන් ලැබිය යුතු රු. 3,192,000ක කුලී ආදායමක් 2014 දී ආදායම් ලෙස හඳුනාගෙන ලැබිය යුතු ණයගැතියන් යටතේ දක්වා තිබුණද, මෙකී මුදල අයකර ගැනීම පිළිබද අවිනිශ්චිතතාවයක් පවතින නමුත්, ඒ සඳහා වන හානිකරණ අගය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විමසා නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | භෞතික වශයෙන් නොලැබුනු කුලී ආදායම් පිළිබදව ගැලපීම් සිදුකළ යුතුවීම. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූලා‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනසරු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) ලැබිය යුතු ගිණුම් | | | | | |
| (i)ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාලය | 3,198,800 | 52,675 | 3,146,125 | 2021 වසරේදී අදාල ආයතන සමග සාකච්ඡා කොට නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදි කිරීමට කටයුතු කළයුතුවීම. |
| | | | | | නිවැරදි කිරීමට කටයුතු කළයුතුවීම. |
| (ii) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 7,481,441 | 188,669 | 7,292,772 | 2021 වසරේදී අදාල ආයතන සමග සාකච්ඡා කොට නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ආ)ගෙවිය යුතු ගිණුම් - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 0 | 8,971,304 | 8,971,304 | 2021 වසරේදී අදාල ආයතන සමග සාකච්ඡා කොට නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදි කිරීමට කටයුතු කළයුතුවීම. |
| (ඇ)ආපදා ණය | 1,260,594 | 0 | 1,260,594 | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ණය අයකර ගැනීමට කටයුතු කළයුතුවීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැතියන්ගේ වටිනාකම රු.25,517,565 ක් වූ අතර 2021 මාර්තු 31 දින වන විට ද එකදු ණයගැතියෙක්ගෙන් හෝ ශේෂ තහවුරු කිරීම් ලැබී නොතිබුණි. තවද එම ණයගැතියන්ගෙන් එකතුව රු.15,987,312 ක් වසර 05 කට වඩා හිඟව පැවති අතර එය, මුළු වෙළඳ ණයගැතියන්ගේ සියයට 63 ක් විය. ඒ අතරින් එක් ණයගැතියෙකුගෙන් ලැබිය යුතු රු. 4,068,000 ක් අයකර ගැනීමට නීත්‍යානුකූල කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණු අතර, තවත් රු.5,140,571 ක් එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාශයෙන් ලැබිය යුතුශේෂයක්ලෙස දක්වා තිබුණි. කෙසේ වුවද, ණයගැතියන්ගේ හානිකරණ අගය සඳහා වෙන් කිරීම් කිරීමට ආයතනය කටයුතු කර නොතිබුණි. | 2020 වසර සඳහා ණයගැති ශේෂ තහවුරු කර ගැනීම සඳහා ලිපි යොමු කර ඇත. 2021 වර්ෂයෙදී ණය ගැතියන් හා අඩමාන ණය වෙන් කිරීම සඳහා ප්‍රතිපත්තියක් හඳුන්වා දීමට කටයුතු කරනු ලැබේ. | ණයගැතියන් සඳහා අඩමාන ණය වෙන් කිරීම් ප්‍රතිපත්තියක් හඳුන්වාදීම සහ හිඟ ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතුවීම. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගෙවිය යුතු එකතුකල අගය මත බදුලෙස රු. 1,452,439 ක් 2014 වර්ෂයට පෙර සිට මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම දක්වා තිබුණු නමුත් එම බදු මුදල් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත | බදු මුදල් නිරවුල් කිරීමටකටයුතු කළ යුතු වීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 39(1) උපවගන්තිය | අමාත්‍යවරයා විමසා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයක් පත්කිරීමට 2021 මාර්තු 31 දින වනවිටත් කටයුතු කර නොතිබුණි. | 2005/38 දරන සංචාරක පනතේ 39(1) වගන්ති ප්‍රකාරව ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය සඳහා නිර්දේශිත නම් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇත. | ශාස්ත්‍රීය කටයුතුමණ්ඩලයක් පත්කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ)2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍යව්‍යාපාර චක්‍රලේඛ 6.5.3 වගන්තිය | 2017 සිට 2019 වර්ෂය දක්වා වූ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට 2021 මාර්තු 31 දින වනවිටත් කටයුතු කර නොතිබුණි | 2015 හා 2016 වර්ෂයන්හි වාර්ෂික වාර්තා පාර්ලිමේන්තු සභාගත කිරීමට කටයුතු කර ඇත. 2017 හා 2018 වර්ෂයන්හි වාර්ෂික වාර්තා පිටපත් ඉදිරි කටයුතු සඳහා සංචාරක අමාතයාංශය වෙත ඉදිරිපත් කර ඇත. 2019 වාර්ෂික වාර්තා මුද්‍රණ කටයුතු සිදු කෙරෙමින් පවතී. | වාර්ෂික වාර්තා පාර්ලිමේන්තු සභාගත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය: | | | |
| මුදල් රෙගුලාසි 371(2) (ආ) | තත්කාර්ය අතුරු අග්‍රිමය එය ලබා දුන් කාර්යය අවසන් කළ වහාම පියවිය යුතු වුවද, අවස්ථා 22කදී ලබා දී තිබුණු රු.5,000 ක සිට රු. 250,000ක් දක්වා වූ පරාසයක ගෙවා තිබුණු තත්කාර්ය අතුරු අග්‍රිමය පියවීම සඳහා දින 20 ක සිට දින 236ක් දක්වා අතර කාලයක් ගතකර තිබුණි. | අත්තිකාරම් ලබා දීම අභ්‍යන්තර චක්‍රලේඛයක් මගින් නිවැරදි කර ඇත. | තත්කාර්ය අතුරු අග්‍රිමය එය ලබා දුන් කාර්යය අවසන් කළ වහාම පියවිය යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 මූල්‍යප්‍රතිඵල

---

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.204,886,499ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු. 629,050ක අතිරික්තයක් විය. ඒඅනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 205,515,549ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ සංචාරක සංවර්ධන බදු සහ අපගමන බදු ආදායම් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන්හේතු වීතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 අනාර්ථික ගනුදෙනු

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 දී තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීමට රු.3,771,216 ක් වැයකර තිබුණ ද, ආයතනයේ අවශ්‍යතාවයන් සමග නොගැළපීම හේතුවෙන් එම පද්ධතිය අත්හැර දමා තිබුණි. | 2014 වර්ෂයේ දී තොරතුරු පද්ධති සංවර්ධයනය සඳහා වැයකර ඇති රු. 2,262,730 ක ප්‍රමාණය අධ්‍යක්ෂ මණ්ඩලය විමසා ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත. | ආයතනයේ අවශ්‍යතාවයන් සමග ගැලපෙන පරිදි තොරතුරු පද්ධති සංවර්ධනය කිරීමට කටයුතු කළයුතුවීම. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2011 දී ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබී තිබුණ මෝටර් රථයක් සමාලෝචිත වර්ෂය දක්වා ආයතනය භාවිතා කරන නමුත්, මෙකී මෝටර් රථයේ අයිතිය ආයතනයට පවරා ගැනීමට හෝ එම රථය තක්සේරු කර ගිණුම් ගත කිරීමට හෝ සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි. | ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ලද වාහනයේ අයිතිය පවරා ගැනීම සඳහා තව දුරටත් කටයුතු කරගෙන යනු ලැබේ. | වාහනයේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම සහ තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ)සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමුද්‍රව්‍ය සැපයුම්කරුවන් ලියාපදිංචි නොකර 2019 වර්ෂයේ ලියාපදිංචි වූ | 2019 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේදී විවිධ හේතුන් මත | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම සහ බැහැරවීම්වලට අදාලව |

| | | |
|---|---|---|
| සැපයුම්කරුවන්ගෙන් 2019 වර්ෂයේ එකහවූ මිල ගණන්වලින් බැහැරව වෙළඳපළ වටිනාකම රු.10,406,662 ක අමුද්‍රව්‍යමිලදී ගෙන තිබුණි. මෙකී බැහැරවීම්වලට අදාල හේතු විගණනය වෙත ඉදිරිපත් නොකළ අතර, මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ද ලබාගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට ප්‍රමාද වූ බැවින් , 2019 අප්‍රේල් සිට 2020 මැයි මස දක්වා කාලච්ඡේදය වෙනුවෙන් අමු ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් ප්‍රදානය කරන ලදී .<br>2020 වර්ෂයේ මාස කිහිපයක් වෙනුවෙන් නැවත සැපයුම්කරුවන් ලියාපදිංචිය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම ආර්ථික වශයෙන් වාසිදායක නොවන බැවින් 2019 වර්ෂය සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය තවදුරටත් දීර්ඝ කරන ලදී. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතු වීම. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | -------------------------------- | -------------- |
| ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 217 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 191 ක් වීමෙන් ඒ තනතුරු 26 ක් පුරප්පාඩුව පැවතිණි.එම පුරප්පාඩු අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අනධ්‍යයන) තනතුරක්, අධ්‍යක්ෂ (වෙළඳ) තනතුරක්, ජොෂ්ඨ කථිකාචාර්ය තනතුරු 08 ක් සහ සහකාර කථිකාචාර්ය තනතුරක් ඇතුළත්ව ඇත | අදාල තනතුරු සඳහා අවශ්‍යතාවය අනුව ඉදිරියේදි බඳවා ගැනීමට කටයුතු කරනු ඇත | පුරප්පාඩු වී ඇති තනතුරු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුවීම. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

------------------------------------------

**4.4 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

-------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | -------------------------------- | ------------- |
| 2020 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාකාරකම් 09 ක් සඳහාරු. මිලියන 17.1 ක් වෙන් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ දී එම ක්‍රියාකාරකම් කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, ඒ තුල ගබඩා | පැවති Covid 19 වසංගත තත්වය මත ක්‍රියාකාරි සැලැස්මෙ සඳහන් බොහො ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට නොහැකි වු නමුත් ගබඩා කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීමේ කටයුතු වල ලංසු ඇගයීමේ | ක්‍රියාකාරී සැලැස්ම වඩා සාර්ථක කළමනාකරණ මෙවලමක් ලෙස යොදාගත යුතුවීම. |

කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම සහ ස්ථාවර වත්කම්කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා වෙන් කරන ලද රු.මිලියන 7 ක්ද ඇතුලත්ව තිබුණි. තවද, ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු ක්‍රියාකාරකම් 4 ක් සඳහා වර්ෂය තුළදී සියයට 50කටත් වඩා අඩුවෙන් මුදල් උපයෝජනය කර තිබුණි.

කාර්යය සිදු කර ගෙන යමින් පවතී.